# සමූපකාර සේවක කොමිෂන් සභාව - වයඹ පළාත

## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு - வடமேல் மாகாணம்

## Co-operative Employees Commission – North Western Province

මගේ අංකය / எமது இல / My No } ස.සේ.කො. 06/උපදෙස් ලිපි

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } ~~2019.04.26~~ 2019.08.23

ස.සෙ.කො. උපදෙස් ලිපි අංක01-2019

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමූපකාර සමිති,

පළාත් ග්‍රාමීය බැංකු හා පාරිභෝගික සංගම්,

ස.ණ.ස. සංගම්, ස.ණ.ස. සමිති, වෙනත් සමිති හා සංගම්වල

ගරු සභාපතිවරුන් වෙත,

**<u>සමූපකාර සේවකයින්ට උසස්වීම් ලබා දීම.</u>**

සේවක උසස්වීම් සම්බන්ධයෙන් පැවැත්වෙන කාර්ය සාධන කමිටු සඳහා ඔබ ආයතනය මගින් ලිපිගොනු ඉදිරිපත් කිරීමේදී ඊට අදාළ සියලුම ලිපි ලේඛන සම්පූර්ණ කර එකවර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් නැවත නැවත විමසීම් කිරීමට සිදුවේ. මේ නිසා ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව කාරුණිකව දැනුම් දෙමි.

02. ඒ අනුව අදාළ උසස්වීම් සඳහා වූ අයදුම්පත්‍රය හා සේවකයාගේ පෞද්ගලික ලිපිගොනුව ඇගයීම් කමිටුවට ඉදිරිපත් කිරීමේදී පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීනව තිබිය යුතු අතර, පහත දැක්වෙන ලිපි විධිමත් පරිදි ඇතුළත් කර එම ලිපි කොඩිකර සටහන් තබා ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද උසස්වීම් අයදුම්පත්‍රය.
2. පූර්ව සේවා කාලයට අදාළ පත්වීම් හා උසස්වීම් සඳහා වූ සමූපකාර සේවක කොමිෂන් සභා නියෝග ලිපි.
3. එම කාලය තුළ විනයානුකූල කටයුත්තකට භාජනය වී නොමැති බවට හෝ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කර නොමැති බව ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකය.
4. විනය කටයුතු ඇත්නම් ඊට අදාළ ලිපි ලේඛන.
5. අදාළ කාලය තුළ ලබාගත් නිවාඩු පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද විස්තර වාර්තාවක් (වැටුප් රහිත නිවාඩු හෝ විදේශ නිවාඩු ලබා ඇත්ද නැද්ද යන්න සඳහන් කරන්න).
6. සාමාන්‍ය කාර්ය සාධනය යටතේ උසස්වීම අනුමත කරන්නේ නම්,
   I. ඇගයීමට භාජනය කරන වසර 10 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවට සහතිකය.
7. විශේෂ කාර්ය සාධනය යටතේ උසස්වීම් අනුමත කරන්නේ නම්,
   I. උසස්වීම සඳහා සළකා බැලීමට ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සහතිකයේ සහතික කළ ඡායා පිටපත.
   II. සමූපකාර සේවක කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 3/2018 හි 3 ඡේදය ප්‍රකාරව උක්ත සහතිකය බඳවා ගැනීමේදී, මීට පෙර උසස් කිරීමකදී හෝ අතිරේක වැටුප් වර්ධක ගෙවීමකදී සලකා නොමැති බවට සහතිකය.
   III. ඇගයීමට භාජනය කරන වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවට සහතිකය.
8. ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ ඡායා පිටපත.

රේණුකා පී. විජේරූප,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

පිටපත :
1. සමූපකාර සංවර්ධන කොමසාරිස් / රෙජිස්ටාර් - වයඹ පළාත - දැ.ගැ.පි. හා අ.ක.ස.
2. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල, හලාවත , කුලියාපිටිය, මහව - දැ.ගැ.පි.


නව කාර්යාල සංකීර්ණය, දෙවන මහල,වයඹ පළාත් සභාව New Provincial Council Office Complex, second Floor Kurunegala.

දුරකථන අංක / தொலைபேசி / Telephone No } සභාපති / தலைவர் / Chairman } 037-2228151 ; ලේකම් / செயலாளர் / Secretary fax } 037-2233853 ; කාර්යාලය / அலுவலகம் / Office } 037-2233853